සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

කෘෂි විද්‍යාව I	08 S I	13 ශ්‍රේණිය	පැය දෙකයි

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1සිට 50තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදන්න.

1) වල් පැලෑටි "වැඩෙන පරිසරය" මත සිදු කරන වර්ගීකරණයේදී " මඩෙහි වැඩෙන " ආකාරයේ වල් පැලෑටියක් වන්නේ,

1. හිරාපලා 2. දියසියඹලා 3. දියගෝවා 4. මාරුක් 5. වල්කරාබු

2) ක්ෂුද්‍ර ප්‍රචාරණයේදී මුල් ඇද්දවීම අවධියේදී පෝෂක මාධ්‍ය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. රෝපණ මාධ්‍යයට සයිටොකයිනීන් හෝර්මෝනය පමණක් යොදනු ලැබේ.
2. රෝපණ මාධ්‍යයට ඔක්සින් හෝර්මෝනය පමණක් යොදනු ලැබේ.
3. රෝපණ මාධ්‍යයට ඔක්සින් වැඩි සයිටොකයිනීන් අඩු ප්‍රමාණවලින් යොදනු ලැබේ.
4. රෝපණ මාධ්‍යයට ඔක්සින් හා සයිටොකයිනීන් හෝර්මෝන සමාන ප්‍රමාණවලින් යොදනු ලැබේ.
5. රෝපණ මාධ්‍යයට ඔක්සින් හෝ සයිමොකයිනීන් හෝර්මෝන කිසිවක් එකතු නොකරයි.

3) පහතරට වියලි කලාපය සඳහා වඩාත් උචිත පාත්ති වර්ගය වනුයේ

1. ගිල් වූ පාත්ති 2. උස් වූ පාත්ති 3. සමතලා පාත්ති
4. ඇලි හා වැටි ආකාර පාත්ති 5. උස් වූ පාත්ති හා සමතලා පාත්ති

4) කෘෂි ඉඩම් වල බිම් සැකසීම සඳහා බිම් සැකසීමේ උපකරණ භාවිතා කරන අතර ඒවායින් සිදු කරන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A - විශාල පස් කැට පොඩි කිරීම හා කලවම් කිරීම
B - පස් කැපීම සහ පෙරලීමෙන් විශාල පස් කුට්ටි සෑදීම
C - පැල,පේළි අතර ඇති වල් පැළෑටි තලා පසට යට කිරීම

ඉහත A,B හා C ක්‍රියාකාරකම් ඉටු කරන උපකරණ පිළිවෙලින්,

1. තැටි නගුල, භ්‍රමණ පොරුව, රිජරය.
2. භ්‍රමණ පෝරුව, තැටි නගුල, ජපන් රොටරි විඩරය.
3. කොකු නගුල, රිජරය, භ්‍රමණ පෝරුව.
4. තැටි පෝරුව, තැටි නගුල, රිජරය.
5. රිජරය,කොකු නගුල,ජපන් රොටරි විඩරය.

දෙවන පිටුව බලන්න

5) ස්භාවිකව ස්වපරාගනය සිදුවන බෝග පමණක් අඩංගු වනුයේ ,
1. බඩ ඉරිඟු , සෝගම් , කුරක්කන්
2. දඹල, කව්පි,කඩල
3. වැටකොළු, රාබු,ගෝවා
4. අමු මිරිස්,වම්බටු,තම්පලා
5. සූරියකාන්ත,අලිපේර,තක්කාලි

6) බෝග අස්වනු වල පරිණත බව නිරීක්ෂණය කිරීමට භාවිතා කල හැකි කායික විද්‍යාත්මක සාධකයක් වන්නේ
1. තෙල් ප්‍රමාණයයි.
2. අම්ල ප්‍රමාණයයි.
3. විශිෂ්ට ගුරුත්වයයි.
4. නිෂ්පාදනය වන එතිලින් ප්‍රමාණයයි.
5. පුෂ්පහට ගැනීමේ දින ගණනයි.

7) ආහාරයේ ප්‍රෝටීන ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඌන වීම හේතුවෙන් හට ගන්නා රෝගයක් වනුයේ ,
1. මැරස්මස්
2. ක්වොශියෝකෝර්
3. ගල ගණ්ඩය
4. රක්තහීනතාවය
5. අධි රුධිර පීඩනය

8) ගව දෙනුන් පාලනයේදී යොදා ගන්නා උපකරණයක් පහත දැක්වේ.එම උපකරණය විය හැක්කේ,

1. කෘත්‍රිම සිංචන තුවක්කුව.
2. පෙරහන් කෝප්පය.
3. කිරි දෝවන යන්ත්‍රය.
4. කෘත්‍රිම යෝනිය.
5. ට්‍රොකා කැනියුලා උපකරණය.

9) ජලය තිරසර ප්‍රයෝජනයට ගැනීම හා සංවර්ධනය වන රටවල ඉඩම් සම්පත ඵලදායිව ප්‍රයෝජනයට ගැනීම ඉලක්ක කරගත් ලාභ නොලබන අන්තර්ජාතික ආයතනයකි.
1. ආහාර හා කෘෂිකර්ම සංවිධානය.
2. අන්තර් ජාතික ජල කළමනාකරණ ආයතනය.
3. ලෝක සෞඛ්‍ය සංවිධානය.
4. එක්සත් ජාතීන්ගේ සංවිධානය.
5. අන්තර් ජාතික සහල් පර්යේෂණ ආයතනය.

10) එක්තරා ප්‍රදේශයකට දිනක් තුල ලැබුණු වර්ෂාපතනය 70 mm ක් ලෙස සටහන් විය.එම පාඨාංකය ලබා ගැනීමට භාවිත කල වර්ෂාමානයේ විශ්කම්භය 10cm නම් එදින වර්ෂාමානයේ එකතු වූ ජල පරිමාව වන්නේ,
1. 220 cm^3
2. 440 cm^3
3. 550 cm^3
4. 55 cm^3
5. 420 cm^3

11) විද්‍යාගාර තත්ව යටතේ පාංශු තෙතමනය මැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
1. පිපෙට්ටු ක්‍රමය.
2. ක්ෂේත්‍ර ආතතිමාන ක්‍රමය.
3. භාරමිතික ක්‍රමය.
4. ද්‍රවමාන ක්‍රමය.
5. ජිප්සම් කුට්ටි ක්‍රමය.

12) ගොවියකු විසින් පහතරට වියළි කලාපයේ අක්කර දෙකක පමණ වූ භූමියක සමචතුරස්‍රාකාර ක්‍රමයට සිටුවා ඇති කර්තකොලම්බන් අඹ වගාවක් සඳහා ක්ෂේත්‍රය අසල ඇති වාරි ඇලකින් ජලය ලබා ගැනීමට සැලසුම් කර ඇත.එම ක්ෂේත්‍රයට වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,
1. ඇලි වැටි ජල සම්පාදනයයි.
2. බේසම් ජල සම්පාදනයයි.
3. විසිරුම් ජල සම්පාදනයයි.
4. පිටාර ජල සම්පාදනයයි.
5. බිංදු ජල සම්පාදනයයි.

13) දර්ශිය ද්විබීජ පත්‍ර බීජයක කොටස් සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. බීජ ලපය - කරල තුල වූ නටුවට බීජය සම්බන්ධ වන ස්ථානය වන අතර බීජ ප්‍රරෝපණයෙදී ප්‍රථමයෙන් නිපාතය මගින් ජලය ඇතුළු වේ.

B. බීජ අනුද්වාරය - බීජය වර්ධනය වන අවස්ථාවේදී බීජය මාතෘ ශාකයෙන් පෝෂණය ලබා ගැනීම සිදු කරයි.

C. බීජෝපරිය - බීජ ප්‍රරෝහණයේදී ශාකයේ අග්‍රස්ථය ලෙස වර්ධනය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.

4. A හා C පමණි. 5. B හා C පමණි.

14) වර්ධක ප්‍රවාරණ ක්‍රමයක් ලෙස බද්ධ කිරීමෙන් නව ශාක ලබා ගනියි.පහත රූප සටහනින් නිරූපණය කර ඇති බද්ධ ආකාරය වනුයේ,

1. පැළි බද්ධය
2. H බද්ධය
3. T බද්ධය
4. පැලුම් රිකිලි බද්ධය
5. කිරුළු බද්ධය



15) මල් වල රතු (R) පැහැය කහ (r) පැහැයට ප්‍රමුඛ වේ.උස (T)ශාක මිටි (t) ශාකයට ප්‍රමුඛ වේ. නුමුහුම් උස රතු පැහැති මල් දරණ ශාකයක පරාග නුමුහුම් උස කහ පැහැති මල් දරන ශාකයක කලංකය මත පතිත වූ විට ලැබෙන දුහිතෘ ශාක වල ජන්මාණු දර්ශය වන්නේ,

1. TtRr 2. ttRr 3. TTRR 4. TTRr 5. TTrr

16) බෝග වගාවේදී යොදා ගන්නා ආරක්ෂිත ගෘහ පිළිබදව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. පොලිතින් ගෘහ ජල සංරක්ෂණය සඳහා වඩාත් වැදගත් වේ.
2. පොලිතින් ගෘහ සැකසීමට හරිතාගාර වලට වඩා වියදමක් දැරිය යුතුය.
3. ලණු ගෘහ සුදුසු වන්නේ පත්‍රමය එළවළු සඳහා පමණි.
4. පොලිතින් ගෘහ සුදුසු වන්නේ වර්ධක ප්‍රවාරණ බෝග සඳහා පමණි.
5. ශ්‍රී ලංකාවේ වර්තමානයේ වඩාත් ප්‍රචලිත ආරක්ෂිත ගෘහ ආකාරය වන්නේ හරිතාගාර වේ.

17) පහත දැක්වෙන්නේ බෝග වගාවන්ට හානි කරන පලිබෝධයකි.පහත පලිබෝධකයා විය හැක්කේ,



1. වී වගාවේ මුල් කා දමන බිම් ඌරකි.
2. වට්ටක්කා බෝගයේ පත්‍ර කා දමන එපිලැක්නාය.
3. මිරිස් බෝගයේ කොල කොඩ වීමට හේතු වන මයිටාවකි.
4. ගොයම් බෝගයේ සුරා යුෂ උරා බොන ගොයම් පැල මැක්කා ය.
5. අන්නාසි බෝගයේ මතුපිට යුෂ උරා බොන අන්නාසි පිටි මකුණාය.

18) පලිබෝධ පාලනය සඳහා යොදා ගනු ලබන “එන්ඩොසාල්ෆාන්” රසායනික ද්‍රව්‍ය පිලිබද පහත වගන්ති සලකන්න.

A. ඕගැනෝක්ලෝරීන් රසායනික කාණ්ඩයට අයත් කෘමිනාශකයකි.

B. අහිතකර අවශේෂ පරිසරයේ නොරැඳෙන බැවින් දිගකල් නොපවතින කෘමිනාශකයකි.

C. ජලයේ දිය නොවන සංඝටක කාබනික ද්‍රාවයක දියකර සාදාගත් තෛලෝද ආකාර කෘමිනාශකයකි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය වන්නේ ,

1. A පමණි 2. B පමණි. 3. C පමණි. 4. A හා B 5. A හා C

CamScanner

19) ක්ෂුද්‍ර ජීවීන් මගින් ආහාරයක ඇති ප්‍රෝටීන කුමන ක්‍රියාවලියකට ලක් වීමෙන් නරක් වේද?

1. පූතිභවනය 2.පැසීම 3.කැරමලීකරණය 4.මුඩු වීම 5.මෙලාඩ ප්‍රති යාව

20) භාණ්ඩයක ප්‍රවාහනයට හා පරිහරණයට පහසු වන සේ කරනු ලබන ඇසුරුම වන්නේ,

1. ප්‍රාථමික ඇසුරුම 2. පාරිභෝගික ඇසුරුම 3. ප්‍රවාහන ඇසුරුම
4. ද්විතියික ඇසුරුම 5.රික්තක ඇසුරුම

21) කුකුල් පාලනයේ දී යොදා ගන්නා බිත්තර රක්කවන සම්බන්ධව නිවැරදි වගන්තිය වනුයේ,

1. බිත්තර රක්කවනයක උෂ්ණත්වය වැඩි වුව හොත් පැටවකු පිටතට ඒමට ගතවන කාලය වැඩි වේ.
2. බිත්තර රක්කවනයක සාමාන්‍යයෙන් උෂ්ණත්වය කුකුළු වර්ගය මත වෙනස් වේ.
3. බිත්තර රක්ක වීම හා පැටවුන් ඉපදීම එකම කොටසේ සිදුවන විට එය තුල උෂ්ණත්වය 37.8 C^0 විය යුතුය.
4. බිත්තර රක්ක වීම ආරම්භ කල දින සිට දිනපතා බිත්තර හැරවීම සිදු කල යුතු වේ.
5. බිත්තර රක්කවනයක ආර්ද්‍රතාවය පලමු සතියේ සිට ක්‍රමයෙන් අඩු කල යුතු අතර 2/3 පැටවුන් එලියට එන විට එය 75% විය යුතුය.

22) සංරක්ෂක ගොවිතැන පිලිබද නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. පාංශු ඛාදනය අධික වේ.
2. වියදම අධික යෙදවුම් භාවිතය නිසා නිෂ්පාදන වියදම වැඩිය.
3. ශුන්‍ය හා අවම බිම් සැකසීමේ ක්‍රම භාවිතයේදී වල්නාශක භාවිතය නිසා පරිසර දූෂණය අධික වේ.
4. ජෛව විවිධත්වය අඩු වේ.
5. ඒක බෝග වගාව යොදා ගනියි.

23) පහත දී ඇති වගන්ති අතුරින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

A. ගොවිපලක අධික ශබ්ද තතත්ව යටතේ වැඩ කිරීමෙන් හෘදස්පන්දන වේගය වැඩි විය හැක.
B. අභිස්පන්දනය යනු අධික ශබ්දය නිසා ඇති විය හැකි ආපදාවකි.
C. අධික කම්පන තත්ව නිසා අගිලි හිරිවැටීමේ තත්ව ඇති විය හැක.
D. විජලනය නිසා නිල වර්ණතාවය ඇති විය හැක.

1. A හා B පමණි 2. B හා C පමණි. 3. C හා D පමණි
4. A හා D පමණි. 5. සියල්ලම ය.

24) පලිබෝධ වල ගහන විචලතා දැක්වෙන කල්පිත ප්‍රස්ථාරය පහත දැක්වේ.



මෙහි C කලාපයෙන් ඔබබට පලිබෝධ ගහණයක් ඇති වීමට හේතුවක් විය හැක්කේ,

1. නිර්දේශිත පොහොර මිශ්‍රණ භාවිතය.
2. බෝග අතර නියමිත පරතරය පවත්වා ගැනීම.
3. ක්ෂේත්‍රයේ එක් බෝගයක් පමණක් වගා කිරීම.
4. පිරිසිදු රෝපණ ද්‍රව්‍ය භාවිතය.
5. ක්ෂේත්‍රයේ ජලවහන තත්ව දියුණු කිරීම.

25) මෝසම් වර්ෂා ජලය භාවිතයෙන් කරනු ලබන ලබන වගාවන් හි අස්වැන්න වියළි කාලයේ වාරි ජලයෙන් ලබා ගන්නා අස්වැන්නට වඩා අඩුය.මෙයට ප්‍රධාන හේතුව වන්නේ,

මෝසම් කාලයේ දී,

1. පවතින අඩු උෂ්ණත්වය නිසා ප්‍රභාසංස්ලේෂණ වේගය අඩු වී අස්වැන්න අඩු විමයි.
2. වලාකුළු වලින් අහස වැසීම නිසා ලැබෙන ආලෝක තීව්‍රතාවය අඩු වීමෙන් ප්‍රභාසංස්ලේෂණ වේගය අඩු විමයි.
3. පාංශු ඛාදනය නිසා පසේ සාරවත්භාවය අඩු විමයි.
4. පවතින අධික ආර්ද්‍රතාවය නිසා පූටිකා වැසී ප්‍රභාසංස්ලේෂණයට බලපෑමයි.
5. පවතින අධික වර්ෂාපතනයෙන් ශාක පත්‍ර වලට හානි විම නිසා ප්‍රභාසංස්ලේෂණ අඩු විමයි.

26) පාංශු පැතිකඩක් සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. පාංශු පැතිකඩ සංවර්ධනයෙන් අවුරුදු 100කට පමණ පසු වෘක්ෂලතා රෙගොලිතය මත වැඩේ.
B. A කලාපය තුල කාබනික ද්‍රව්‍ය අඩුවෙන් පවතින අතර B කලාපයේ බහුලව දක්නට ලැබේ.
C. පාංශු පැතිකඩ සංවර්ධනයෙන් වසර 1000ක් පමණ ගත වූ විට යකඩ ඔක්සයිඩ හා සිලිකේට් මැටි ඛනිජ නිෂ්පාදනය වී පාංශු පැතිකඩේ පහලට ගමන් කර A කලාපයෙහි රතු වර්ණකයක් ඇති වේ.
D. පැතිකඩ සංවර්ධනයෙන් වසර 10000 ට පමණ පසු B කලාපයට ඉහලින් E කලාපය ඇති වේ.

1. A හා B පමණි.
2. A හා C පමණි
3. A හා D පමණි.
4. C හා D පමණි.
5. A, B හා C පමණි.

27) ඉහල කිරි නිෂ්පාදනයක් ලබා ගත හැකි ග්‍රිෂියන් ගව දෙනුන් පාලනයට වඩාත් යෝග්‍ය සත්වපාලන කලාපය වනුයේ,

1. උඩරට කලාපය
2. පහතරට තෙත් කලාපය
3. මැදරට කලාපය
4. පොල් ත්‍රිකෝණය
5. වියළි කලාපය

28)



ඉහත රූපසටහනින් දැක්වෙන ජල පොම්පය පිලිබඳ නිවැරදි වරණය වන්නේ,

1. පොම්පය සඳහා වන මූලික වියදම අධිකය
2. මඩ හා වැලි සහිත ජලය පොම්ප කල හැක.
3. විසර්ජන ජල පහර අඛණ්ඩ නොවේ.
4. ස්ථානගත කිරීමට විශාල ඉඩක් අවශ්‍ය වේ.
5. ක්‍රියාත්මක කිරීමට විදුලිය හෝ ඉන්ධන අවශ්‍ය නොවේ.

29) දියගත වගාව (Hydrophonics) යනු ,

1. පාවෙන ජලජ ශාක වගා කරන ක්‍රමයකි.
2. නිමග්න ජලජ ශාක වගා කරන ක්‍රමයකි.
3. ජලය තුල ශාක වගා කරන ක්‍රමයකි.
4. මත්ස්‍යයන්ට ආහාර ලෙස ශාක වගා කරන ක්‍රමයකි.
5. පස වෙනුවට ජලය වගා මාධ්‍ය ලෙස භාවිත කර ශාක වගා කරන ක්‍රමයකි.

30) පහත දැක්වෙන්නේ කෘමියෙකුගේ දර්ශීය මුඛ උපාංග නිරූපණය කරන රූප සටහනකි. මෙහි A හා B කොටසේ පිළිවෙලින් විය හැක්කේ,



1. පූර්වෝෂ්ඨය හා අධෝහනු වේ.
2. හනුක උපාංග හා අධරය වේ.
3. අධෝහනු හා හනුක උපාංග වේ.
4. අධරය හා පූර්වෝෂ්ඨය වේ.
5. අධෝහනු හා අධරය වේ.

31) පහත දැක්වෙන්නේ බීජ සාම්පලයක විද්‍යාගාර පරීක්ෂණයකින් ලබා ගත් පරීක්ෂණ දත්ත කිහිපයකි.

A. තෙතමනය ප්‍රතිශතය - 14%
B. ප්‍රරෝහණ ප්‍රතිශතය - 80%
C. ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව - 95%
D. කැඩුණු හා යාන්ත්‍රික හානි වූ බීජ - 100/500g

ඉහත ලක්ෂණ අතුරින් සිටුවීමට වඩාත් සුදුසු බීජ වල අඩංගු විය යුතු ලක්ෂණ වනුයේ,

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. B හා C පමණි.
4. C හා D පමණි. 5. A , B හා C පමණි.

32) ජෛව පොහොර ආකාරයක් සම්බන්ධව ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

A. පාංශු බැක්ටීරියා ආකාරයකි.
B. වායුගෝලීය නයිට්‍රජන් ශාකයට ලබා ගත හැකි නයිට්‍රජන් ලෙස පසට එකතු කිරයි.
C. Poaceae කුලයේ ශාක සමග සහජීවීව වාසය කරයි.

ඉහත ජෛව පොහොර ආකාරය විය හැක්කේ,

1. Azotobacter 2. Clostridum 3. Rhizobium
4. Azospirillum 5.Psudomonas

33) මුල් කිරි සම්බන්ධව නිවැරදි නොවන්නේ ,

1. මුල් කිරි වල සාමාන්‍ය කිරි වලට වඩා ප්‍රෝටීන ප්‍රමාණය වැඩිය.
2. පැටවුන් ඉපදී දින 3ක් අනිවාර්යෙන් මුල් කිරි ලබා දිය යුතුය.
3.මුල් කිරි වල මේද ගෝලිකා විශාල බැවින් එය පහසුවෙන් ජීරණය කල හැකිය.
4. පැටවුන් මුල් වරට මල පහ කිරිම සඳහා මුල් කිරි උපකාරි වේ.
5.ජීර්ණය කිරිමකින් තොරව අවශෝෂණය කල හැකි පෝෂක මුල් කිරි වල අඩංගු වේ.

34) පසෙහි ඇති ජලයෙන් උදුනේ වියලා ගැනීමෙන් පමණක් පසෙන් ඉවත් කල හැකි ජලයේ Pf පරාසය වනුයේ,

1.0 – 2.5 2. 2.5 – 4.2 3. 2.5 – 4.2 4. 4.5 – 7 5. 4.2 - 6.0

35) පාංශු ක්ෂාරියතාවය ඉවත් කිරිමට පසට යොදන ද්‍රව්‍යයක් වනුයේ,

1. $CaCO_3$ 2. $CaSO_4$ 3. $Ca(OH)_2$ 4. CaO 5.$CaCO_3MgCO_3$

36) කොම්පොස්ට් සෑදීමේ යොදා ගන්නා අමුද්‍රව්‍ය වල ප්‍රශස්ථ C/N අනුපාතය වනුයේ,

1. 15:1 2. 25:1 3. 35:1 4. 45:1 5.55:1

37) බෝග වගාවේදී නයිට්‍රජන් ඌනතා ලක්ෂණ වලට සමාන ඌනතා ලක්ෂණ බෝග වල පෙන්නුම් කරන්නේ,

1. යකඩ හිඟ වීමෙනි. 2. සල්ෆර් හිඟ වීමෙනි.
3. මැග්නිසියම් හිඟ වීමෙනි. 4. පොටෑසියම් හිඟ වීමෙනි.
5. පොස්පරස් හිඟ වීමෙනි.

CamScanner

38) ශාක ප්‍රභාසංස්ලේෂණ සීග්‍රතාව හා වායුගෝලය CO_2 සාන්ද්‍රණය අතර සම්බන්ධතාව දැක්වෙන ප්‍රස්ථාරය වනුයේ,

1.


2.


3.


4.


5.


39) වර්ෂා පෝෂිත ගොවිතැනේ පියවර කිහිපයක් පහත දැක්වේ.

A. වැට සැකසීම
B. වනාන්තර එළි කිරීම
C. බිම් සැකසීම
D. පිළිස්සීම
E. බීජ සිටුවීම

මෙහි නිවැරදි පියවර අනුපිළිවෙල වනුයේ,

1. ABCDE 2. BDACE 3. DBACE
4. BADCE 5. BCDAE

40) වගා ක්ෂේත්‍රය තුල හෝ වගා ක්ෂේත්‍රය අතර විචලතාව නිරීක්ෂණය කරමින් හා අගයමින් එම තත්ව වලට ප්‍රතිචාර දැක්වීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සම්පත් කාර්යක්ෂම භාවිත කරමින් සිදු කරනු ලබන ගොවිපල කළමණාකරණ සංකල්පය වනුයේ,

1. සංරක්ෂණ ගොවිතැනය. 2. යථාතත්‍ය ගොවිතැනය. 3.සමෝධානික ගොවිතැනය.
4. කාබනික ගොවිතැනය. 5. තිරසර ගොවිතැනය.

41) ගව දෙනෙකුගේ කිරි අස්වැන්න පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. කිරි දෙවීමේදී විනාඩි 8 – 10 අතර කාලයේදී ඉක්මනින් කිරි දොවා ගැනීමෙන් කිරි අස්වැන්න වැඩි වේ.
B. කිරි දෙවුම් වාර දෙකක් අතර කාලය පැය 08 කට වඩා වැඩි වීමෙන් කිරි අස්වැන්න අඩු වේ.
C. ක්ෂීරණයේ මුල් සති 6 – 8 දී කිරි නිෂ්පාදනය අඩු අතර එය පසුව ක්‍රමයෙන් වැඩි වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි
4. A හා B පමණි. 5. B හා C පමණි.

42) දේශීය ගවයන්ගේ කිරි නිෂ්පාදනය ඉතා අඩුය.සත්ව අභිජනන ක්‍රමවේද භාවිතයෙන් කිරි නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීමට බලාපොරොත්තුවෙන් සිදු කල හැකි වඩාත් සාර්ථක අභිජනන ක්‍රමය වනුයේ,

1. යුරෝපීය ගව වර්ගයක් සමග දෙමුහුම් කිරීම ය.
2. ඉන්දීය ගව වර්ගයක් සමග දෙමුහුම් කිරීම ය.
3. ඉහල නිෂ්පාදනයක් පෙන්වන දේශීය ගවයන් සමග මුහුම් කිරීම ය.
4. පලමුව යුරෝපීය ගව වර්ගයක් සමග දෙමුහුම් කර පසුව ඉන්දීය වර්ගයක් සමග මුහුම් කිරීම ය.
5. පලමුව ඉන්දීය ගව වර්ගයක් සමග දෙමුහුන් කර පසුව යුරෝපීය ගව වර්ගයක් සමග මුහුම් කිරීම ය.

CamScanner

43) සත්ව පාලනයේදී යොදා ගන්නා තාප කලාප ප්‍රස්ථාරය පහත දැක්වේ.



ගොවිපලක බිත්තර දමන කිකිලියක් ඉහත A ලෙස දක්වා ඇති කලාපය තුළදී පෙන්විය හැකි හැසිරීමේ ප්‍රතිචාරයක් විය විය හැක්කේ,

1.ජල ආගනුව වැඩි වීමයි.
2. සතුන් කණ්ඩායම් ලෙස ගොනු වී සිටීමයි.
3. දහඩිය දැමීමයි.
4. එකතැන රැදී සිටීමයි.
5. හති දැමීමයි.

44) ශාකයක වර්ධනය නිශේධනය කිරීමට භාවිත කරන ශාක හෝර්මෝනය වන්නේ,

1. ගිබරලින්ය 2. ඔක්සින් ය 3.සයිටොකයිනින්ය
4. එතිලින් ය 5. ඇබ්සසික් අම්ලය

45) නිෂ්පාදන සාධකයක ලක්ෂණ කිහිපයකි.

A. ගලා යන සම්පතකි.
B. සීමා සහිත සම්පතකි.
C. භෞතික වශයෙන් සංචරණය කල නොහැක.
D. නිෂ්පාදන ක්‍රියාවලියේ පුරෝගාමියා වේ.

"භූමිය " යන නිෂ්පාදන සාධකයේ ලක්ෂණයක් වනුයේ,

1. A හා B පමණි. 2.B හා C පමණි. 3. C හා D පමණි. 4.A හා D පමණි 5.B හා D පමණි.

46)



A ලක්ෂය මගින් පෙන්නුම් කරනුයේ කුමන සම්බන්ධතාවයේ සමතුලිත අවස්ථාවද?

1. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව
2. යෙදවුම් - මිල සම්බන්ධතාව
3. යෙදවුම් - නිමැවුම් සම්බන්ධතාව
4. ආදායම් - වියදම් සම්බන්ධතාව
5. නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාව

47) වෙළඳපොලට කුකුල්මස් සැපයුම වැඩි වීමට පහත කවර සාධකය නිසා සිදු වන්නේද?
1. අධික උෂ්ණත්වය පැවතීම
2. මාළු වල මිල අඩු වීම
3. කුකුල් ආහාර වල මිල අඩු වීම.
4. කුකුලන් අතර පුල්ලෝරම් රෝගය පැතිරීම
5. කුකුල් මස් පිලිබඳව පාර්භොගිකයා අතර මිත්‍යා මත පැතිර යාම.

48) පූර්ණ තරගකාරී වෙළඳපොලක බිත්තර ඉල්ලුම හා සැපයුම පහත ශ්‍රිතයෙන් දැක්වේ.

$$Qs = 50 + 5p$$
$$Qd = 3p + 150$$

බිත්තර සඳහා සමතුලිත මිල හා බිත්තර ප්‍රමාණය පිලිවෙලින් දැක්වනුයේ,

1. 70 , 500 2. 50 , 450 3.50, 300 4.150 , 60 5. 145,30

49) A වෙළඳපොල අගය දාමයක් පහත දැක්වේ.



ඉහත අගය දාමයට අනුව පාරිභෝගිකයා භාණ්ඩ සඳහා ගෙවිය යුතු මිල වන්නේ රුපියල්,

1. 80 2. 100 3. 140 4.160 5. 200

50) ශෂය මාරුව සඳහා සුදුසු බෝග කාණ්ඩ යෙදීමේ අනුපිළිවෙල තෝරන්න.

1. ධාන්‍ය බෝග → අල බෝග → එළවළු බෝග → රනිල බෝග
2. අල බෝග → එළවළු බෝග → රනිල බෝග → ධාන්‍ය බෝග
3. රනිල බෝග → එළවළු බෝග → ධාන්‍ය බෝග → අල බෝග
4. ධාන්‍ය බෝග → රනිල බෝග → අල බෝග → එළවළු බෝග
5. එළවළු බෝග → රනිල බෝග → ධාන්‍ය බෝග → අල බෝග

**

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

කෘෂි විද්‍යාව II	08	S	II	13 ශ්‍රේණිය	පැය තුනයි

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

A කොටස - ව්‍යුහගත රචනා

1) A) මානව ජීවිතය පවත්වා ගැනීම සඳහා උපකාරි වන බෝග වගාව , සත්ව පාලනය , ධීවර හා වන සම්පත් ආශ්‍රිත ව්‍යුත්පන්න "කෘෂි නිෂ්පාදන" නම් වේ.

පහත කෘෂි නිෂ්පාදන සඳහා උදාහරණය බැගින් දක්වන්න.

I. ප්‍රධාන ප්‍රාථමික අවධි නිෂ්පාදනය..

II. ප්‍රධාන ද්විතික අවධි නිෂ්පාදනය ....

III. අතුරු නිෂ්පාදන ....

(3X 2 = 6)

B) වර්ෂාපතනය යනු ශ්‍රී ලංකාවේ බෝග වගාව කෙරෙහි බලපාන ප්‍රධානතම දේශගුණික සාධකය වේ.

I. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන යාන්ත්‍රණ තුන නම් කරන්න.

1 ....

2 ....

3 .... (3X 2 = 6)

II. ශ්‍රී ලංකාවට පහත සඳහන් කාල සීමාවන්හිදී ලැබෙන වර්ෂාපතන ආකාර නම් කරන්න.

a. මැයි සිට සැප්තැම්බර් මාස දක්වා ....

b. ඔක්තොබර් , නොවැම්බර් මාස ....

c. මාර්තු , අප්‍රේල් මාස .... (3X 2 = 6)

C) පසක භෞතික ස්වභාවය විස්තර කරන ලක්ෂණ පාංශු භෞතික ලක්ෂණ ලෙස හඳුන්වයි.

I. පාංශු වයනයේ කෘෂිකාර්මික වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2 X3=6)

II. පාංශු දණ්ඩ ඝනත්වය බෝග වගාවට හිතකර ලෙස පවත්වා ගැනිම සඳහා ක්ෂේත්‍රයේ සිදු කල හැකි ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2X3 =6)

III. පසක දක්නට ලැබෙන " හැඩය අනුව" පාංශු ව්‍යුහ ආකාර හතරක් සඳහන් කරන්න.

1...

2...

3...

4... (4X2 = 8)

D) පහත දැක්වෙන්නේ පසක යම් ගැටළුවක් විසඳීම සඳහා සිදුකල ක්‍රියාකාරකමක් අවසානයේ සිදුවන රසායනික ක්‍රියාවලියකි.



I. ඉහත පාංශු ගැටළුව කුමක් විය හැකිද?

.... (1X 3 = 3)

II. ඒ සඳහා භාවිතා කල රසායන ද්‍රව්‍ය සඳහන් කරන්න

.... (1X 3 = 3)

E) ශාක වලට අවශ්‍ය පෝෂක නිසි පරිදි ලබා දීමට පොහොර භාවිත කරයි.

I. ගොවීන් විසින් බෝග වලට යොදන ප්‍රධාන පොහොර කාණ්ඩ තුන සඳහන් කරන්න.

1...

2...

3... (3X 3 = 9)

II. එම කාණ්ඩ අතුරින් තිරසර කෘෂිකර්මාන්තයේදී භාවිත කල හැකි නව ප්‍රවණතාවයක් ලෙස හඳුන්වා දිය හැකි පොහොර කාණ්ඩය කුමක්ද?;

.... (1X 2 = 2)

III. ඉහත නම් කල පොහොර කාණ්ඩය සඳහා නිදසුනක් සඳහන් කරන්න.

.... (1 X 2 = 2)

IV. අනිසි පොහොර භාවිතය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවකි.එමගින් ඇති වී තිබෙන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

1...

2... (2X 3 = 6)

F) වී වගාව සඳහා බිම් සැකසීමේ ක්‍රමය "මඩ කිරිම" ලෙස හඳුන්වන අතර මඩ කරගත් බිමක බීජ හෝ පැල සංස්ථාපනය කරයි.

I. වී වගාව සඳහා බිම් සැකසීමේ ප්‍රධාන පියවර සඳහන් කරන්න.

1...

2...

3... (3X3 = 9)

II. වී වගාවේදී පමණක් යොදා ගන්නා තවාන වර්ගය නම් කරන්න.

.... (1X2 = 2)

තෙවන පිටුව බලන්න

CamScanner

G) අවශ්‍යතා සපුරා ගත හැකි ප්‍රමාණයෙන් ජලය වසර පුරාම හෝ වසරේ යම් කාලයක් තුල ලබා ගත හැකි ජල මූලාශ්‍ර ජල ප්‍රභවයක් ලෙස හඳුන්වයි.



I. ඉහත A ජල ප්‍රභවය හඳුනා ගන්න
.... (1X 3 = 3)

II. ඉහත ජල ප්‍රභවය භාවිතා කිරීමේ වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.
a. වාසිය ....
b. අවාසිය.. (2X3 = 6)

III. වගා භූමියක් සඳහා සුදුසු ජල ප්‍රභවයක් තෝරා ගැනීමේදි සලකා බැලිය යුතු ප්‍රධාන සාධක 3ක් සඳහන් කරන්න.
1..
2..
3.. (3X3 = 9)

H) දේශගුණික දත්ත රැස් කර විශ්ලේෂණය කිරිම බෝග වගාවන්ට දේශගුණික විපර්යාස මගින් ඇතිකරන බලපෑම් අවම කරගත හැකිය.

I. දේශගුණික විපර්යාස හේතුවෙන් වර්ෂාපතනය ඇතිකරන බලපෑම අතර ප්‍රධාන විචලතා තත්ව දෙකක් සඳහන් කරන්න.
1..
2.. (2X2 = 4)

II. එම විචලතා හේතුවෙන් බෝග වගාවට ඇති විය හැකි අහිතකර තත්ව දෙකක් සඳහන් කරන්න.
1..
2.. (2X 2 =4)

2) A) වගා බිමෙහි ඇති අතිරික්ත ජලය කෘත්‍රිම ක්‍රම යොදා ගනිමින් පසෙන් ඉවත් කිරිම ජලවහනය කිරිම ලෙස හඳුන්වයි.

I. බෝග වගා කරන භූමියක ජල වහනය දුර්වල විමට හේතු වන කරුණු දෙකක් සඳහන් කරන්න.
1..
2.. (2X2 = 4)

II. දුර්වල ජලවහන තත්ව යටතේ පසේ නිපදවෙන විෂ වායු වර්ග දෙකක් සඳහන් කරන්න.
1..
2.. (2X2 = 4)

III. දුර්වල ජලවහන තත්ව ඇති භූමියක වගා කරන බෝග වල දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
1..
2.. (2X2 = 4)

CamScanner

B) ශාක වලට ද්‍රව්‍ය අවශෝෂණය විමට විවිධ යාන්ත්‍රණ උපයෝගි කර ගනියි.

I. ශාක අක්‍රිය ලෙස පෝෂක අවශෝෂණයට භාවිත කරන ක්‍රම දෙකක් නම් කරන්න.

1...

2... (2X 2 = 4)

II. ශාක මුල් මගින් අවශෝෂණය කරන ජලය කඳ තුලින් ඉහලට ගමන් කිරීමට අවශ්‍ය බලය ලබා දෙන යාන්ත්‍රණ දෙකක් නම් කරන්න.

1..

2.. (2x2 = 4)

III. ශාක වල ද්‍රව්‍ය පරිවහනය ප්ලෝයම තුලින් සිදුවන බව පරීක්ෂණාත්මකව පෙන්වීම සඳහා භාවිතා කල හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2X 2 = 4)

C) ශාක ප්‍රචාරණය යනු ලිංගික හා අලිංගික ක්‍රම මගින් නව ශාක බිහි කිරීමේ ක්‍රියාවලියයි.

I. පහත බෝග සඳහා වඩාත් සුදුසු වර්ධක ප්‍රචාරණ ක්‍රමය සඳහන් කරන්න.

a. ටියුලිප් ....

b. රෝස ....

c. සමන්පිච්ච ....

d. රඹුටන් .... (4X3 =12)

II. දඬු කැබලි මගින් සිදුකරන ශාක ප්‍රචාරණයේදී දඬු කැබලි මුල් ඇද්දවීම කෙරෙහි බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක දෙක බැගින් සඳහන් කරන්න.

a. අභ්‍යන්තර සාධක

1..

2..

b. බාහිර සාධක

1..

2..

(4X3 = 12)

D) බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණයේදී බහුලව යොදා ගන්නා පැලැස්තර බද්ධයේ පියවර නම් කල රූප සටහනකින් ඇඳ දක්වන්න.

(1X5 = 5)

E) බීජ මගින් ශාක ප්‍රචාරණයේ නිරෝගී බීජ තෝරා ගැනීම තුලින් උසස් අස්වනු ලබා ගත හැකිය.

I සහතික කල බීජ නිෂ්පාදන වැඩ පිලිවෙලෙහි පහත බීජ කාණ්ඩ වල නිර්දේශිත ලේබලයේ වර්ණය සඳහන් කරන්න.

a. අභිජනන බීජ..

b. අත්තිවාරම් බීජ..

c. ලියාපදංචි බීජ..

d. සහතික කල බීජ.. (4X3 = 12)

II. පහත බීජ සිටුවීමට පෙර සුප්තතාවය ඉවත් කිරීමේ ප්‍රතිකාර සිදු කරයි.එම බීජ සුප්ත වීමට හේතුව සඳහන් කරන්න.

a. සියඹලා..

b. තේක්ක..

c. තත්කාලි.. (3X3 = 9)

F) පටක රෝපණය විද්‍යාගාරයක් තුල ඇති පහත උපකරණ හඳුනා ගන්න.



i...................................... ii...................................... (2X3 = 6)

G) ශාක වල වරණය අභිජනනයේදී සිදු කරනු ලබන්නේ, ප්‍රයෝජනවත් ලක්ෂණ සහිත ශාක දෙමාපියන් වශයෙන් තෝරා වෙන් කර ගෙන ඔවුන් නිතර සහාභිජනනයට අනුබල දී දෙමුහුම් අභිජනනය වැලැක්වීමයි.

I. ශාක වල වරණය සිදු කරන ප්‍රධාන ක්‍රම දෙක සඳහන් කරන්න.

1..

2.. (2X3 = 6)

II. ශාක අභිජනනයේදී විකෘති ඇති කරන ක්‍රම දෙක සඳහන් කරන්න.

1..

2.. (2X3 = 6)

H) කෘෂිකර්මාන්තයේදී මුහුණ දීමට සිදුවන ආපදාවන් අවම කිරිම ඉතා වැදගත් වේ.

I. කෘෂි ක්ෂේත්‍රයේ ආපදා වැඩි විමට හේතු දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2X2 = 4)

II. කෘෂිකර්මාන්තයේදී ගොවින්ට ඇතිවන ආතතිය වැලැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2X2 = 4)

3) A) පාලිත තත්ව යටතේ බෝග වගාවේදී වායව හා පාංශු තත්ව පාලනය සඳහා ආරක්ෂිත ව්‍යුහ යොදා ගනියි.බෝග වගාවේදි භාවිත වන තාවකාලික ප්‍රචාරක ව්‍යුහ ආකාර තුනක් සඳහන් කරන්න.

1..

2..

3.. (3x2 = 6)

B) නිෂ්පාදන වගාව නවින කෘෂිකර්මාන්තයේදී ඇතිවන ගැටලු අවම කිරිමට භාවිත වගා ක්‍රමයකි.නිර්පාංශු වගාවෙහි එවැනි වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2x3 = 6)

C) කෘමි පලිබෝධකයින් කෘමි ගෝත්‍ර ලෙස වෙන් කිරීම මගින් ඔවුන් හදුනාගෙන පාලන ක්‍රම යෙදීමට පහසු වේ.

පහත සදහන් කෘමි පලිබෝධ වර්ග ඔවුන් අයත් වන ගෝත්‍රය හා හානිය සිදු කරන මුඛ උපාංග ආකාරය සදහන් කරන්න.

කෘමි වර්ගය	කෘමි ගෝත්‍රය	මුඛ උපාංග
I. සේනා දලඹුවා	....	....
II. කළු පොල් කුරුමිණියා	....	....
III. දුඹුරු පැළ කීඩැවා	....	....
IV. ඉල් මැස්සා	....	....

(8 x 2 = 16)

D) රෝග ත්‍රිකෝණය බෝග වගාවේ රෝග හදුනා ගැනිමට සහ පාලනයට යොදා ගන්නා ආකෘතියකි.

I. පහත දැක්වෙන රෝග ත්‍රිකෝණයේ A,B හා C පාද නම් කරන්න.



(3x3 = 9)

II. ශාක රෝග පැතිරීමේ ප්‍රධාන ක්‍රම දෙකක් සදහන් කරන්න.

1..

2.. (2x 3 = 6)

III. ශාක රෝග පාලනය සදහා යොදා ගන්නා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමෝපායන් දෙකක් සදහන් කරන්න.

1..

2.. (2x 3 = 6)

E) පලිබෝධනාශක යෙදීමේ විවිධ උපකරණ භාවිත කරන අතර ඒවා විවිධ නිර්ණායක අනුව වර්ග කෙරේ.පහත එක් එක් නිර්ණායක යටතේ පලිබෝධනාශක යොදන උපකරණ වර්ගීකරණය කරන්න.

I. රසායනික ද්‍රව්‍යයේ භෞතික ස්වභාවය අනුව පලිබෝධනාශක යොදන උපකරණ

1..

2..

3..

4.. (4 X 3 = 12)

II. අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය යටතේ පලිබෝධනාශක යොදන උපකරණ

1..

2.. (2X 3 = 6)

III. දියර යොදන ප්‍රමාණය අනුව පලිබෝධනාශක යොදන උපකරණ

1..

2..

3.. (3X 3 = 9)

CamScanner

F) එක් ව්‍යාපාරයක අතුරුඵල වෙනත් ව්‍යාපාරයක අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් කටයුතු කිරීම සමෝධනික ගොවිතැන වේ.සමෝධනික ගොවිතැනේදී ක්‍රියාත්මක වන ප්‍රධාන පද්ධති සඳහන් කරන්න.

1...

2...

3...

4... (4X 3=12)

G) තිරසර කෘෂිකර්මාන්තයේදී විවිධ බෝග වගා රටා හා ක්‍රම භාවිතා කරමින් පරිසරයට වන අවම කිරීමට උත්සහ කරයි.

I. තිරසර කෘෂිකර්මාන්තයේදී භාවිත කරන බහු බෝග රටා ආකාර දෙකක් සඳහන් කරන්න.

1...

2... (2 X 3 = 6)

II. ඒක බෝග වගා පද්ධතින් සඳහා වන උදාහරණ බෝග දෙකක් සඳහන් කරන්න.

1...

2... (2 X 3 = 6)

4) A) පසු අස්වනු හානිය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මුහුණ පා ඇති ප්‍රධානතම ගැටලුවකි.

I. බෝග වලට පසු අස්වනු හානිය සිදුවිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

1...

2... (2 X 2 = 4)

II. පලතුරු වල පරිගණක දර්ශක මැනිමට භාවිතා කල හැකි උපකරණ දෙකක් සඳහන් කරන්න.

1...

2... (2 X 3 = 6)

III. බෝග අස්වනු නෙලිමේදී පරිණත බව දැන සිටීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1...

2... (2X 3 = 6)

B) ක්ෂිරණ මුරයක් තුල වියලි ද්‍රව්‍ය ආගනුව කිරි නිෂ්පාදනය හා දේහ බර වෙනස් වන ආකාරයේ පහත ප්‍රස්ථාරයෙන් නිරූපනය වේ.



I. ඉහත සඳහන් ලෙස ගව දෙනුන්ගේ වියළි කාලය යන්න හඳුන්වන්න.

....

.... (1X 4 = 4)

II. ඉහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි වියළි කාලයේදී වියලි ද්‍රව්‍ය ආගනුව ක්‍රමයෙන් අඩු විමට හේතුව සඳහන් කරන්න.

....

.... (1X 4 = 4)

III. ගව දෙනුන් වියළි කිරීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1..

2.. (2X 4 = 8)

C) කුකුළු පැටවුන් පාලනය සම්බන්ධව පහත ප්‍රකාශ සත්‍ය හා අසත්‍ය බව සඳහන් කරන්න.

I. කුකුළු පැටවුන් බෲඩරයට හඳුන්වා දුන් පලමු දින 2 – 3 තුල උතුරුවා නිවාගත් ජලය මද උණුසුම් ව තිබියදී පානයට ලබා දිය යුතුය. ....

II. පැටවුන් රක්කවන බෲඩරයේ චික් ගාර්ඩ් එක භාවිත කරනුයේ කුකුළු පැටවුන්ට අවශ්‍ය නියමිත උෂ්ණත්වය ඇති ප්‍රදේශයේ ඔවුන් රඳවා ගැනීමේ අරමුණකි. ....

III. කුකුල් ආහාර සලාක අතුරින් අඩුම ප්‍රෝටීන ප්‍රතිශතයක් ඇත්තේ පැටවුන් සඳහා වන ආහාර සලාකයේය. ....

IV. කුකුල් පැටවුන් සඳහා මරෙක්ස් එන්නත සති 3 කදී ලබා දිය යුතුය ....

(4X 2 = 8)

D) ගොවිපල සතුන්ගේ වර්ධනය ,නිෂ්පාදනය මෙන්ම නිරෝගී බවට ඔවුන්ට ලබා දෙන ආහාර වැදගත් වේ.පහත එක් එක් ආහාර ආකාර සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.

I. පෝෂ්‍ය රනිල ....

II. ශාක සම්භවයක් සහිත ප්‍රෝටීන පරිපූරක ....

III. කාබෝහයිඩ්‍රේට ශක්ති පරිපූරක .... (3X2 = 6)

E) ගවයාගේ ආහාර ජීරණ පද්ධතියේ සංකීර්ණ ආමාශයේ රූප සටහනක් පහත දැක්වේ.



මෙහි පහත කොටස් වලින් ඉටුවන ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

A. ....

B. ....

C. ....

D. .... (4X 3 = 12)

II. ඉහත කොටස් අතුරින් වසු පැටවකුගේ ඌන වර්ධනයක් පෙන්වන කොටස සඳහන් කරන්න.

.... (1 X 3 = 3)

CamScanner